ප්‍රායෝගික කෘෂිකර්මය

# තක්කාලි වගාව

ලයිකෝපර්සිකන් එස්කියුලේටම් යන උද්භිද විද්‍යාත්මක නමින් හඳුන්වන තක්කාලි ශාඛය සොලනේසියේ කුලයට අයත්ය. වියලි කලාපය, උඩරට අතර මැදි කලාපය, තෙත් කලාපය (උඩරට තෙත් කලාපය හැර) යන දේශගුණික කලාප වල සාර්ථකව වගා කල හැක.

තක්කාලි වල අඩංගු පෝෂ්‍ය පදර්ථ අතර ඛනිජ ලවන වන සෝඩියම්, පොටෑසියම්, සල්ෆර්, කැල්සියම්, හා යකඩ අඩංගු වන අතර විටමින් ඒ හා විටමින් සී ද අඩංගුවේ. මෙයට අමතරව වැදගත් ඇමයිනෝ අම්ලද ඔක්සලික් අම්ලයද සුළු ප්‍රමාණ වලින් අඩංගුවේ.

**නිර්දේශිත ප්‍රභේද :-**

1. කටුගස්තොට ඩබ්ලිව්. ආර්.
2. ටී 146
3. මාග්ලෝබ්
4. රෝමා
5. බියෑන්ස්

**විවිධ දේශගුණික කලාප සඳහා නිර්දේශිත ප්‍රභේද :-**

1. තෙත් කලාපය (උඩරට තෙත් කලාපය හැර)
   (අ) කටුගස්තොට ඩබ්ලිව්. ආර්.

2. උඩරට අතර මැදි කලාපය
   (අ) කටුගස්තොට ඩබ්ලිව්. ආර්.
   (ආ) මාර්ග්ලෝබ්
   (ඇ) බියෑන්ස්

3. උඩරට වියලි කලාපය
   (අ) රෝමා
   (ආ) බියෑන්ස්

4. පහත රට වියලි කලාපය
   (අ) කටුගස්තොට ඩබ්ලිව්. ආර්.
   (ආ) රෝමා

**වගාව පිහිටුවන කාලය :-**

වගා කරන කාලයන් විවිධ ප්‍රදේශවලට මෝසම් වර්ෂාව ලැබෙන කාලයන් අනුව සුළු වශයෙන් වෙනස් විය හැක. නමුත් පොදුවේ




එළවළු ප්‍රවාහන කෙරෙන අවස්ථාවක්

වියලි කලාපයේ යල් කන්නය සඳහා තවාන් දැමීම මාර්තුවේ මැද සිට මැයි දක්වා සිදුවේ. පොදුවේ වියලි කලාපයේ මහ කන්නය සඳහා තවාන් දැමීම නොවැම්බර් මාසයේ මැද හරියේ සිදුවේ. උඩරට අතර මැදි කලාපයේ සහ තෙත් (උඩරට තෙත් කලාපය හැර) යල් කන්න සඳහා අප්‍රේල් මැදද, මහ කන්න සඳහා නොවැම්බර් මැදද තවාන් දැමීම සිදුවේ. අවාරයේ ලැබෙන අධික මිළ ලබා ගැනීම සඳහා අවාර යන්හිද තක්කාලි වැවීමට සමහර ගොවීන් පෙලඹී ඇත

**තවාන් පාලනය :-**

01. වටපනු රෝග, මිටු මැරීමේ රෝගය හා දිය මලන්කෑමේ රෝග වලින් තොර, හොඳින් හිරුඑළිය ලැබෙන, ජල වහනය හොඳින් සිදුවන ස්ථානයක් තවාන සඳහා තෝරා ගත යුතුවේ. අක්කරයකට පැල ලබා ගැනීමට වීටර 3 X මීටර 1 උස් තවාන් පාත්ති 10 අවශ්‍යවේ තෝරා ගත් ස්ථානයේ පස ආම්ලික නම්, තවානේ වර්ග මීටර 3 කට ඩොලමයිට් කිලෝ ග්‍රෑම් 1/2 ත් 1 ත් අතර ප්‍රමාණයක් බීජ සිටුවීමට සති දෙකකට පෙර යෙදිය යුතුවේ.

---

කෘෂිකර්ම නිලධාරී
(පුහුණු හා සංනිවේදන)
පී. කේ. කේ. ආර්. පෙරේරා විසිනි

---

02. හලාගත් මතුපිට පස් හා හලාගත් කොම්පෝස්ට් 1 : 1 අනුපාතයට මිශ්‍රකර සාද ගත්තා තවාන් මිශ්‍රණයෙන් කූඩ 10 ක් මීටර 3 X 1 තවාන් පාත්තියකට යෙදිය යුතුවේ.

03. තවාන සෙස් කර ගිණි තැබීමෙන් පසු මොරුට්, කැප්ටාන් වැනි දිලීර නාශක යන් හා කෘමි නාශකයක් භාවිතා කර තවාන් පාත්ති හැකිතාක් දුරට පිවානුහ රණය කරගත යුතුය.

04. ස. මී. 1 ක් ගැඹුරැති එකිනෙකට සෙ. මී. 15 දුරැති පේලි තවානේ සලකුණු කරගත යුතුය. බීජ අවශ්‍යතාවය අක්කරයට ග්‍රෑම් 125-150 අතරවේ. බීජ සිටුවීමට පෙර බීජ වලට බීජ ප්‍රතිකාර කිරීම සුදුසුය. තක්කාලි බීජ කිලෝග්‍රෑම් එකකට තයිරැම් (වෙළඳ නම පොමසාල්) හෝ කැප්ටාන් ග්‍රෑම දෙකක් මිශ්‍ර කල යුතුය.

05. වසුන් කර ජල සම්පාදනය කල යුතුය. සතියකින් පමණ බීජ ප්‍රරෝහණය වන විට සම්භ වසුන ඉවත් කල යුතුය. බීජ සිටවූ විගස කුහුඹුවන් ගෙන් හා මීයන්ගෙන් බීජ වලට හානි සිදුවිය යුතුය. බීජ ප්‍රරෝහණය වීමත් සමග කියන් පණු හානිය අධික ප්‍රදේශවල සුදුසු කෘමි නාසකයක් යෙදිය යුතුල. (කෘමි මර්ධන කොටස බලන්න) තවාන් පැල වල පත්‍ර වලට හානි කරන දළඹු හානි මර්ධනය සඳහා මොනොක්‍රොටපස් නම් (වෙළඳ නම් මොනොක්‍රොටපස්, නුවක්‍රොන්, ඇසොඩ්‍රින් හා මොරිපස්) කෘමිනාශකය යෙදිය යුතුය.

06. තක්කාලි තවාන් වලට තෙත් කාලගුණයක් ඇති විට පශ්චාත් අංගමාර රෝගය ඇතිවිය හැක. එය මර්ධනයට ඇන්ත්‍රකොල් ඩූසෙකොල් එරොන්, පොලිරාම් එම්, වොන් ඩසෙබ් වැනි දිලීර නාශකයක් ඉසීම කල යුතුය. දියමලන් කෑමේ රෝගයද ඇති විය හැකි අතර තවාන් පාත්ති පිවානුහ රණය, බීජ ප්‍රතිකාර කිරීම, නිසි ගැඹුරට බීජ සිටුවීම තවාන් පසේ තෙතමනය පාලනය කිරීම වැනි ක්‍රියා මාර්ග අනුග

**(33 වන පිටුව බලන්න)**

# තක්කාලි වගාව
(29 වෙනි පිටුවෙන්)

මනය කිරීමෙන් එම රෝගය ඇති වීම වළකා ගැනීමට හැකිවේ. වල් මර්ධනය දිරිමත් පැල ලබා ගැනීමට ආධාර වේ.

07. තක්කාලි වල තවාන් කාලය දින 15කි. තවාන් පැල ගැලවීමට දින පහකට පෙර සිට ජලය සැපයීම අඩුකර හා හිරු රැස් වලට හොඳින් ක්‍රමයෙන් හුරු කිරීමෙන් තවාන් පැල දඩි කිරීමට කටයුතු කළ යුතුවේ. තවාන් පැල ගැලවීමට පෙර දින තවාන හොඳින් තෙත් කළ යුතුවේ.

08. සමහර ගොවීන් ගිල්ලු තවාන් ද, තවත් සමහර ගොවීන් කුට්ටි තවාන්ද තක්කාලි තවාන් සඳහා භාවිතා කරයි.

**ක්ෂේත්‍රය සකස් කිරීම :-**

බිම පෙරලා කැට පොඩි කර මට්ටම් කර ගත යුතුවේ. පසේ ආම්ලික බව අධික ඉඩම් වලට පැල සිටුවීමට සති දෙකකට පෙර ඩොල මයිට් දමා පස සමහ කලවම් කල යුතුවේ. උස් පාත්ති, උස් පලල් පාත්ති හෝ වැටි සහ කානු ලෙස බිම් සකස් කර ගෙන පැල සිටු වීම කල හැක. හොඳ ජලවහනයක් ඇතිවන සේ බිම සකස් කර ගැනීම වැදගත් වේ.

**සිටුවන පරතරය :**

කටුගස්තොට ප්‍රභේදය සඳහා සෙ. මී. 60 X සෙ. මී. 50 පරතරයද, මාර්ග්ලොබ් සඳහා සෙ. මී. 75 X සෙ. මී. 40 පරතරයද ඇතිව එක වලක එක පැලය බැගින් සිටුවීමට නිර්දේශ කර ඇත. සිටුවන ස්ථානවල කුඩා වලවල් සකස් කර හොඳින් දිරූ කාබනික පොහොර යොදු පස සමහ මිශ්‍ර කර ගත යුතුවේ, පැල සිටුවා දින 7 සිට දින 10ක පසු නිර්දේශිත මූලික රසායනික පොහොර පැල වටා හොඳයි.

**පැල සිටුවීම :-**

දින 14 පමණ වයසැති නිරෝගී දිරිමත් තවාන් පැල මුල් වලට අවම හානියක් සිදුව නසේ ගලවා ගත යුතුය. පැලවල කරටි කැඩී මෙන් වැලකී සිටිය යුතුය. සවස් කාලයේ තවාන් පැල සිටුවන්නේ නම් වඩා යෝග්‍ය වේ. පැල සිටවූ විගස ජල සම්පාදන කල යුතුය. අවශ්‍ය අවස්ථ වලදී අර්ත සිටවූ පැල වලට සෙවන සැපයීම කල යුතුය. ප්‍රදේශයේ කෘත් පනු හානිය අධික නම් පැල සිටවූ විගස සුදුසු කෘමි නාශකයක් ඉසිය යුතුය.

**ජල සම්පාදනය :-**

පැල සිටුවා දින හතරක් හෝ 5 ක් යන තුරු දිනපතා ජලය සැපයීම කල යුතුය. පැල මුල් අල්ලා ගැනීමත් සමහ ජලය සපයන කාලාන්තරය ක්‍රමයෙන් යැඩි කර දින හතරකට වතාවක් වියලි කාලගුණයකදී පල සම්පාදනය කල යුතුවේ. ක්‍රමවත් හා අඛණ්ඩ ජල සැපයු මක් මල් හටගන්නා කාලයේදී හා ගෙඩි වර්ධ නය වන කාලයේදී තිබීම ඉතා වැදගත්වේ.

**වල්මර්ධනය :-**

සෑම විටම බෝගය සමහ වර්ධනය වන වල් පැලෑටි මර්ධනය කිරීමට පියවර ගත යුතුවේ. වල් පැලෑටි වල වර්ධන වේගය හා වල් ගහණය අනුව වල් මර්ධන දෙකක් අතර කාලය හා වල් මර්ධනය කළ යුතු වාර ගණන වෙනස් වේ.

**පොහොර යෙදීම :-**

පැල සිටුවන වලවල් වලට පැල සිටුවීමට දින පහකට හෝ හයකට පෙර කාබනික

පොහොර යොද පස සමග කලවම් කල යුතුවේ. පැල සිටුවා දින 7 සිට දින 10 අතර කාලය කදී පැළ වටා අඟල් 2 හෝ 3 ක් ඈතින් කවා කාරව මූලික රසායනික පොහොර යෙදිය යුතුවේ. 16: 20: 12 එන්. පී. කේ. මිශ්‍රණය (එළවළු අල පොහොර මිශ්‍රණයෙන්) තක්කාලි වගාවේ මූලික පොහොර මිශ්‍රණය ලෙස නිර්දේශ කර ඇත. මෙම මිශ්‍රණයෙන් අක්කරයට කි. ග්‍රෑ. 250 යෙදීමට නිර්දේශ කර ඇත. පොහොර යෙදීමෙන් පසු වගාවට ජලය සැපයීම කල යුතුවේ, පැල සිටුවා සති 6 කට පසුව යූරියා කි, ග්‍රෑ, 50 අක්කරයට යෙදීමට නිර්දේශිතය,

**කප්පාදු කිරීම හා ඉනි සිටවීම :-**

කප්පාදු කිරීම කටුගස්තොට ප්‍රභේදය සඳහා එතරම් අවශ නොවේ. අනිකුත් නිර්දේශිත සිය ළුම ප්‍රභේද සඳහා යම් ප්‍රමාණයක කප්පාදු කිරීමක් අවශ්‍යවේ. කප්පාදු කිරීමෙන් ශාකයේ වර්ධක වර්ධනය පාලනය කරන අතර විශාල ගෙඩි සහිත අස්වැන්නක් ලබා ගැනීමට හැකිවේ. තක්කාලි ගස්වල මල් පට ගැනීම ශාකයේ පාදයේ සිට 6 වෙනි හෝ 7 වෙනි පත්‍ර කක්ෂයන්ගෙන් ආරම්භවේ. කප්පාදු කිරීමේදී පත්‍ර කක්ෂවල ඇති වර්ධක අංකුරයන් ඉවත් කරයි. පත්‍ර කක්ෂවල (6 වෙනි හෝ 7 වෙනි පත්‍රයෙන් පසු) වර්ධක අංකුරයක්ද දක්නට ලැබේ කප්පාදුවේදි ප්‍රධාන කඳට හා තවත් ශාකා එකකට හෝ දෙකකට පමණක් වර්ධන වීමට ඉඩ දෙමින් ඉතිරි සියළුම වර්ධක අංකුර කුඩා කාල යේදි ඇඟිලි තුඩු වලින් අල්ලා ඉවත් කල යුතුවේ. කුඩා කාලයේදීම පත්‍ර කක්ෂවල ඇති වර්ධක අංකුර හා පුෂ්ප අංකුර වෙන් කර ගෙන හඳුනා ගත හැක. සෑම පුෂ්ප අංකුරයකින්ම නිරෝගී ගෙඩි තුනක් හෝ පහක් අතර ප්‍රමාණයක් ඇතිවේ. සෑම තක්කාලි ප්‍රභේදයකටම ඉනි සිටුවීම කල යුතුවේ. ප්‍රධාන කඳ අඩි 1 පමණ උස්වූ විට ඉනනට තබා ප්‍රවේශමෙන් බැඳිය යුතුය. සාමාන්‍යයෙන් අඩි 4-5 උස ඉනි මේ සඳහා භාවිතා කරනු ලැබේ.

**අස්වනු නෙලීම :-**

වගා කරන ප්‍රභේදය අනුව අස්වනු නෙලීමට ගතවන කාලය වෙනස්වෙ. සාමාන්‍යයෙන් මෙය පැල සිටුවා මාස දෙකයි සති දෙකේ සිට මාස තුන දක්වාවේ. ගෙඩි සම්පූර්ණයෙන් ඉදීමට පෙර නෙලා ගත යුතුවේ. දිගු වෘන්තයක් ඉතිරි නොවන සේ ගෙඩි නෙලා ගැනීම මගින් ගබඩා කිරීමේදි හා ප්‍රවාහනයේදි එමගින් වන හානි අඩු කර ගත හැක.

ඇසිරීම :-

ඇසිරීමට පෙර ගෙඩි වල ප්‍රමාණය අනුව වර්ග කරනු ලැබේ. නේපස තැලීම වලකා වලකා ගැනීම සඳහා ලී පෙට්ටි වල අසුරා වෙළඳ පොලට යවනු ලැබේ.

අස්වැන්න :-

තක්කාලි වලින් ලැබෙන අස්වනු ප්‍රමාණය ප්‍රභේදය, විවිධ රෝපන කටයුතු කල ආකාරය, වගා කාලය තුල පැවති දේශගුණික තත්වය ආදිය අනුව වෙනස් විය හැක. සාමාන්‍යයෙන් අක්කරයට කි. ග්‍රෑ. 8500 සිට 11000 දක්වා අස්වැන්නක් ලැබේ.

